
# අපට ඇඹුල ගෙනා..ත් වගෙයි
# ගොඩට යන්න හොඳා...ත් වගෙයි



ගොයම් කපන කාලයට අබිලියන් මාමාගේ මූලිකත්වයෙන් කෙරෙන ගොයම් කවි ගායනය බොහෝ ඈතට ඇසේ. තෙරුවන් වැඳීමෙන් ආරම්භ වන ගොයම් කවි ගොයම් කපා අවසාන වන තුරු ගායනා කරනු ලැබේ.


සරණායි සරණා.........යි බුද්ධා.....ං සරණා..........යි
සරණායි සරණා........යි ධම්මා.......ං සරණා.........යි
සරණායි සරණා.......යි සංඝා........ං සරණා..........යි
සරණායි සරණා......යි මේ..තූ.......ං සරණා..........යි

බුදුන් තිලෝ.....කෙට.......... උත්තම වන්.........නේ
යොදුන් ගණා....ං බුදු.....රැ......ස් විහිදෙන්.....නේ
සඳුන් සුවඳ මා.......ල් ...... පුද කරවාන්......නේ
බුදුන් සරණ සිහි......කර කියමින්..................නේ

දෙයියා......ං අණ සැම.... තැන පවතී.....න්.....නේ
කොයියා...ං අයටා.......ත් දියුණ කරා......න්.....නේ
මයියා....ං දැන කවී...... පද පවසා.........න්.....නේ
දෙයියා...ං වැඳ අව...... සර අර ගා.......න්......නේ

බුදුන් සහ දෙවියන් සිහි කරමින් අරඹනු ලබන ගොයම් කවි ගායනය සමහර ජාතක කථා පුවත් ද සම්බන්ධ වී කියැවෙන අතර, අබිලියන් මාමා නොයෙකුත් තාලවලට වෙනස් කරමින්, ගොයම් කපන පිරිස උද්‍යෝගයට පත්වන ආකාරයට උඩ පනිමින් ද, දෑකැත්ත උඩ විසිකරමින් අල්ලමින් ද, සමහර විටක නටමින් ද ගොයම් කවි කියයි.

ගොයම් කවි ගායනා කරන විලාසයේ ද විටින් විට පවතින අපූර්වත්වයක් වන්නේ වේලාව, අවස්ථාව, ඉතිරිව ඇති කාලය, මෙන් ම කැපීමට ඇති ගොයම්




ප්‍රමාණය අනුව කවි ප්‍රමාණය මෙන් ම කියන තාලය සහ වේගය වෙනස් වීම ය. ඉතිරිව ඇති කාලය අනුව සමහර විට එක පදයක් සිව් වර බැගින් කියවන අවස්ථාද ඇත. ඒ මෙසේ ය.

දෙයියා......ං අණ සැම.... තැන පවතී......න්......නේ
දෙයියා......ං අණ සැම.... තැන පවතී....න්.........නේ
දෙයියා......ං අණ සැම.... තැන පවතී.....න්........නේ
දෙයියා......ං අණ සැම.... තැන පවතී.....න්........නේ

කොයියා...ං අයටා......ත් දියුණ කරා.......න්........නේ
ආදී වශයෙනි.

එමෙන් ම අවස්ථානුකූලව තාලය සහ කවි ද වෙනස් කර ගැයීම ද සිත් ගන්නාසුලු ය. කුඹුරට ඇඹුල ගෙන එනවා දකින විට ඊට උචිත කවි ගායනා කිරීම අරඹයි.

අපට ඇඹුල ගෙනා..ත් වගෙයි
අව්ව බොහොම සැරා...ත් වගෙයි
බඩගිනි දැන් වැඩී...ත් වගෙයි
ගොඩට යන්න හොඳා...ත් වගෙයි

මාගල් ගමු මෙතන එළමු
පෙළට ඉඳිමු පත් කොළ ගමු
බත් බෙදවමු හොඳි බෙදවමු
කන්ඩ බලමු පටන් ගනිමු

යනාදී කවි කියමින් ඇඹුල කොටාබෑම සඳහා සියලු දෙනා දෙපා ඇළට බැස ඇඟපත සෝදා ගනිති. එසේ ම ගොයම් කපා අවසාන වන විට මෙම කවි ගායනා කරමින් දවසේ වැඩ අවසාන කරති.

ගොයම් කපා ඉවර උණා
ඉරු දෙයියෝ පිහිට උණා
ගොවිරාළට සෙතක් උණා
අපේ සිතත් සතුටු උණා

ගොයම් කපා ඉවර උණා
සඳ දෙයියෝ පිහිට උණා
ගොවිරාළට සෙතක් උණා
අපේ සිතත් සතුටු උණා

ගොයම් කපා ඉවර උණා
ගෙදර යන්න සවස් උණා
ගොවිරාළට සෙතක් උණා
අපේ සිතත් සතුටු උණා

පේළියට ගොයම් කපන පිරිස අබිලියන් මාමා කියන ආකාරයට ම කවි ගායනා කරති. වෙහෙස මහන්සියක් නොමැතිව ඉතා විනෝදයෙන් ගොයම් කැපීමට මෙම කවි ඉතා ප්‍රයෝජනවත් වේ. ගොයම් කපන පිරිසට සංග්‍රහ කිරීම ද කුඹුර වගා කරන්නා විසින් නොපිරිහෙළා ඉතාමත් සැලකිල්ලෙන් කරන්නේ ගොයම් කටයුතු දෙවියන්ගේ කාර්යයක් හැටියට සලකාගෙන ය. එසේ ම පළමුව කපනු ලබන ගොයම්වලින් තරමක කොටසක් දෙවියන් වෙනුවෙන් යයි වෙන් කර ගසක බඳිනු ලබන්නේ කුරුල්ලන්ට කෑම සඳහා ය යි මට සිතේ.

ගොයම් කැපීමේ දී සහ ගෙන යාමේ දී මග වැටෙන ගොයම් කරල් එකතු කිරීම සඳහා ගමේ ළමයි සහ මාරහේන වත්තේ ද්‍රවිඩ ළමයි ද පැමිණෙති. ඒවා එකතු කර ගන්නවාට ගොවියාගේ අකමැත්තක් නැත. එසේ ම මීයන් විසින් ගෙන ගොස් ඇති වී, මී ගුල්වලට අත දමා එකතු කර ගැනීම ද කරති. එවකට මී උණ වැනි වසංගත බිය තිබුණේ ම නැත.

ගොයම් පෑගීම සඳහා ක්‍රම දෙකක් භාවිතා කෙරේ. එක ක්‍රමයක් නම් කතිරය බැඳ පයින් පෑගීමයි. වී කුරුණි පහ හය වැපිරෙන කුඹුරුවල ගොයම් කැපීම මේ ආකාරයට බොහෝ විට සිදු වේ. පාවරේ, ලීවලින් කතිර දෙකක් සිටුවා ඒ මැදින් ලීයක් දමා ඒ අතරින් බිමට මාගලක් දමා දෙ-දෙනෙක් හෝ හතර දෙනෙක් දෙපස සිට ගොයම් පෑගීම කරති. අනිත් ක්‍රමය හරකුන්ගෙන් පෑගීම හෙවත් කමත් ගැසීමයි. බොහෝ විට කමත් ගැසීම රාත්‍රී කාලයට ආරම්භ කරනු ලැබෙයි. පැට්‍රෝමැ-ක්ස් ලාම්පු එළියෙන් අවශ්‍ය ආලෝකය ලබා ගැනෙයි.

ඉඩ කඩ ඇති ස්ථානයක හෝ පාවර ගොඩැල්ල යනුවෙන් ගොයම් වැඩ සඳහා ම වෙන් කොට ඇති ස්ථානයක කමත සකස් කරනු ලැබේ. මුලින් ම පිදුරුවලින් වෙනියක් ගොතා පාවර සීමාව සකස් කරනු ලැබේ. එය කරනු ලබන්නේ දිගට ගොතන ලද වෙනිය, සීමා කොන් හතරක් නියම කොට ගෙන කෝටු කීපයක් සිටුවා එම කෝටුවල පරතරය දිගට ම වෙනිය ගැට ගැසීමෙන් ය.. මෙම සීමාවෙන් ඇතුළට යාමට වනිතාවන්ට අවසර නැත.

පාවර මැද ''කම්බාකණුව'' සිටුවනු ලැබේ. මේ සඳහා බොහෝ විට පුවක් ගසක් උපයෝගි කරගනු ලැබේ. කමතට හරක් බැඳීම සඳහා කම්බාකණුව භාවිතා කෙරේ. විශාල ගෝණි මාගල් හෙවත් ගෝණි කටුපන් කම්බාකණුව මැදි කොට අතුරති. සියලු දෙනා එක් වී ගොයම් කොළයෙන් ක්‍රමාණුකූලව ගොයම් උත්පිඩ (දෑතට ගතහැකි කොටස) බැගින් රැගෙන ගොස් කමතේ කම්බාකණුව වටා උස් අතට තබති. කම්බාකණුව වටා ගොයම් තබා අවසාන වුණු විට සියලු වී කරල්වලින් පිරුණු මුදුනත සහිත කමත ඉතාමත් අලංකාර ය. කමතේ සහ සියලු ම ගොවිතැන් වැඩ ආරම්භයේ දී එකින් එකට ම වැඳීම ඉතා උසස් පුරුද්දක් හැටියට මම දකිමි.

බොහෝ විට හරකුන් තුන් දෙනෙකු යොදා ගන්නා අතර සමහරවිට හරකුන් තුන් දෙනා බැගින් වන දෑගක් බඳිනු ලබයි. කම්බා කණුව මුල ම බඳිනු ලබන ගවයා ''මුදුනා'' ය. තුන් වැන්නා හෙවත් අවසානයට බඳිනු ලබන ගවයා ''කලාතේ එකා'' ය. හරක් බැඳීමෙන් පසු ගවයින් දැක්කීම බොහෝ විට වයසින් බාල අයෙකු විසින් කරනු ලබයි.

කමතේ දී මුලින් ම හලා ගන්නා මැඩුවන් (පිදුරු) කොටසක් ගෙන කමත රැකවල් කිරීම කරනු ලැබේ. එය කරනු ලබන්නේ කමත් සීමාවේ මුළු හතරට හතර දෙනෙකු යොදවා එක් අයෙක් කමතෙන් මුලින් ම මැඩුවන් ටිකක් හලාගෙන එක් කොනක සිට එක් අයකු හමුවන තෙක් කතා බහෙන් තොරව මැඩුවන් ගස දෙක හළාගෙන ගොස් ඒ මුල්ලේ සිටින කෙනාට තම අත ඇති මැඩුවන් ගොඩ දෙනු ලබයි. ඒ මුල්ලේ සිටින කෙනා ඊ ළඟ මුල්ලේ සිටින අය වෙත මැඩුවන් හළාගෙන ගොස් තම අත ඉතිරි කොටස ඔහුට දෙයි. මෙලෙස හතර දෙනාගේ ම මුළු හතර සම්පූර්ණ වන තුරු මැඩුවන්වලින් කමත රැකවල් කරනු ලබති.

එවකට කමතේ මාගේ කාර්යය අම්බරුවන් දැක්කීම ය. අම්බරුවන් දැක්කීමේ දී උන් මළපහ කරන විට එම පාවරේ ම ගොයම් හෝ මැඩුවන් ටිකක් ගෙන ගවයාගේ පි-ටුපසට තබා උගේ මළපහ කිරීමේ කාර්යය අවසන් වන තුරු පසු පසින් යා යුතු ය. ගවයන්ගේ ගොමවලට කමතේ දී කියන්නේ ගොම්පස් කියා ය. මා ද අපගේ කමතේ පමණක් නොව වෙනත් කමත්වල ද හරක් දැ-ක්කීම සඳහා ගොස් මුදල් රුපියලක් හෝ වී කුරුණියක් ලබා ගන්නා අවස්ථා බොහෝ ය.

රාත්‍රියේ දී කමතේ සීපද කීම ඉතාමත් විනෝද ජනක ය. මාරහේනේ විල්බට් මාමා, අබිලියන් මාමා සහ ලෙයස් අයියා ද කමත්වල සීපද කීමට මනා දස්කම් ඇති අය ය. සමහර විට කමතින් කමතට, පැලෙන් පැලට තරඟයට සීපද කියන අවස්ථාවන් ද ඇති අතර සී-පදයට පිළිතුරු සීපද කීම ද වටපිටාවේ බො-හෝ දෙනෙකුගේ අමන්දානන්දයට හේතු වේ.

කමතේ දී තනි කකුලකට බර දී සිටීම තහනම් ය. එසේ ම කකුලක් නවාගෙන කිසියම් දෙයක් අල්ලාගෙන සිටීම කෙවිටි පාරක් කෑමට හේතු වේ. කමතේ දී කතා කරන බාසාවේ ද විශාල වෙනස් පිළිවෙතක් ඇත. එයට කමත් භාෂාව යනුවෙන් කියති. සෑම දෙයකට ම වාගේ පාවිච්චි කරන වචන වෙනස් ය. එවන් වචන කීපයක් මගේ මතකයේ හැටියට මෙසේ ය.

**අම්බරුවන්** = ගවයන්
**පුබ්බරුවන්** = බත්
**කොටා බානවා, සාත්තුවෙනවා,** = කනවා, බොනවා
**ගඟුල** = වතුර
**කහට ගඟුල** = තේ වතුර
**පැඟිරි කොළ** = බුලත්
**කහටව** = පුවක්
**සුදුව** = හුණු
**රොඩුකොළ** = දුම් කොළ
**බෝහන් පිරෙනවා** = මියැදෙනවා, මැරෙනවා
**සීරු කරනවා** = ගහනවා, අනිනවා
**ලියන්නාව** = දෑකැත්ත
**යතුර** = කුල්ල
**අතුරන්නාව** = ගෝනි පඩංගු මාගල
**වී පෝරුව** = වී එකතු කරන ලෑල්ලක්
**පිරිවැස්ස** = ගවයන්ගේ කට වැසෙන්නට දමන, අමු පොල්කොළවලින් වියන ලද උපකරණයකි.
**උත්පිඩ** = කොටස (ගොයම් උත්පිඩ, මැඩුවන් උත්පිඩ වශයෙනි.)

මෙවන් වචන රාශියක් ගොවියාගේ කටට හුරුවී ඇත.

කමතේ වැඩ කරගෙන යන අතරතුර දී තේ වතුර, බුලත්පහේ මෙන් ම ඇඹුල ද රැගෙන ගොවි නිව-සේ ගෙවිලිය පිට කමතට පැමිණෙන්නී ය. ඇඹුල කොටාබෑම සඳහා පාවර රැකවල් වලින් පිටතට යන සියලු ම දෙනා එක පේළියකට බිමින් වාඩි වෙති. බිමට කෙසෙල් කොළ එළා බත් සහ මාළුපිනි බෙදීම ගෘහණියගේ රාජකාරියේ කොටසකි. බටපොතු පෙට්ටියෙන් එකින්එක එළියට ගන්නා කොළපත් මුල් ලිහා බත්, මාළු, ව්‍යංජන බෙදයි. මෙම අවස්ථාවේ දී එම කමත අද්දරින් කිසියම් ගමේ කෙනෙකු යනු දුටුවහොත් ''ඕයි එනව පුබ්බ-රුවන් බෝයක් සාත්තුවෙලා යන්න'' යනුවෙන් ඔහුට ද ආරාධනා කරන පුරුද්දක් ද පැවතිණි. අවස්ථාවේ හැටියට එම පුද්ගලයාට කුසගිනි ඇතත් නැතත් එම ඇරයුම ඉවත නොදමා අඩු තරමින් වතුර උගුරක් හෝ පානය කරයි. බුලත් විටක් හෝ හපයි. තේ පානය කරන විට දී වුව ද එසේ ම ය.

**මතු සම්බන්ධයි**